


පොසොම් පෝයට සිල් ගන්න සිරියාවතී හාමිනේ සූජානං උනේ වෙසක් පෝය පහු උනු දා ඉඳලයි උන්දෑට තිබුනු එක ම සුදු සාරියෙ කහ පැල්ලං මතු වෙලා. ඇයි ඉතිං ඒක එළි බහින්නෙ මාස හත අටකට නැත්තං අවුරුද්දකට විතර සැරයක් නේ ! මං ඇහුවා 'අපි ගම්පහ ගිහිං අලුත් සාරියක් ගම්මුද?' කියලා. " ඕන්නැහ්, මං ඕක පැල්ලං ඇරලා හදා ගන්නං" කියලා උන්දෑ කිව්ව හින්දා මාත් කර බා ගත්තා.

කිව්වත් වගේ ඒකෙ පැල්ලං ඇරලා සුදු කර ගෙන හරියට අලුත් සාරියක් වගේ ඇඳ ගෙනයි එදා ඈ සිල් ගන්න පන්සලට යන්න සූජානං උනේ. පෝය දාට සිල් ඇත්තන්ට දානෙ සැපයෙන්නෙ පන්සලෙං. කීපදෙනෙක් හව්ලෙ ඒ වැඩේ පටං ගත්තේ මාස හත අටකට ඉස්සර.

අපේ පන්සලේ නායක හාමුදුරුවෝ - නාරද හාමුදුරුවො ටිකක් අමුතු පෙරලිකාර අදහස් තියන කෙනෙක් බව මං දැනං හිටියා. පොසොම් පෝය දා උදේ අටට විතර පන්සල් පැත්තෙ එන්න කියලා හාමුදුරුවංගෙං මටත් පනිවිඩයක් තිබුනා. සිරියාවතී හාමිනේ පිටත් වෙලා පැයකට විතර පස්සෙ මාත් මූනකට හෝද ගෙන මගේ කැලෑ කෝට්ටෙකත් ඇගේ දවට ගෙන පන්සල පැත්තට ගෑටුවා.

"අප්පෝට සිරි" පන්සලේ ලැගුංගේ පිටිපස්ස පැත්තෙ හරි යුද්දෙ. මහ කල්දේරං හතරක් ලිපේ හරියවට දරසෑම ගිනි තියාපුවා වගේ. ගෑනු පිරිමි දහ දොලොස් දෙනෙක් එතන. හරියට වයං කොරපු ජපම් බෝනික්කො වගේ. සමහරු ලිප්වලට දර දානවා. සමහරු පොල් ගානවා. තවත් සමහරු පොල් මිරිකනවා. හාමුදුරුවො නේද, අන දෙන නිලදාරියා වගේ සැරින් සැරේ එතෙන්ට එනවා, ලිප්වල තියන කල් දේරං වලට එබිකම්පානවා. මාලු හැඳි ගානවා, පිහමනේ වැඩ කරන අයත් එක්ක කතා බහ කරනවා. උන්නාන්සෙත් එදා හරි 'බිසි'.

"සුමේද, තක්කාලි හොදි හීරවන්නෙ නැතුව හෙම්මීං බෙදන්න. අතිං පිඟාන වැහුවොත් බෙදන්න එපා. සමහරුන-"ට තක්කාලි අගුනයි නේ !"

"ඇයි හාමුදුරුවනේ, පොල් සම්බල?" පන්නල හාමිනේ දුර ඉඳ ගෙනම ඇහුවා.

"බොලේ... හැබෑට මට ඒක හාංකවසියක් මතක් උනේ නෑ. අනේ පන්නල හාමිනේ තරහ නැතුව ඒ වැඩේ පටං ගත්තෝනං..."

## පොසොම් පෝයට ලංකාවෙ වෙලාව පැයක් පස්සට

මං දැක්ක ගමං හාමුදුරාවො තල්ලට අල්ල තියා ගෙන, 'මං මේ මඟ බල බලා උන්නා, අප්පුහාමි තාම නැත්තෙ මොකද කියලා. කමන්නෑ, කමන්නෑ, ඕනවටත් වැඩිය පිරිස ඉන්නවා. එහෙනං අප්පුහාමි මේවයි ලුනු ඇඹුල් බලලා අඩු පාඩු කියන්නකෝ. 'හීතල ඇනුම් පදයක් කීවා.

මං ඉතිං හාමුදුරුවන්ට වැඳලා, උගුර කට පාද ගෙන, 'හාමුදුරුවො පන්තියක් දාන බව කිව්වා නං මාත් පාන්දරිං එනවා නෙ ! යි කීවා.

"මං හිතුවා අප්පුහාමි ඔය වගේ උත්තරයක් දේය කියලා. කියූ හාමුදුරුවො මගේ කරට අත තියාන අපට උපස්තාන කරනවා. අද මේ සිල් ඇත්තන්ට දානෙ පන්සලෙං. සියලු ම දේ පන්සලෙං. දානෙ පිලිගන්නන්නෙ අපි. හැබැයි දානෙ ඉව්ං පිහුං වැඩ නං කළේ මේ පිංවතුං. ගමේ ම ඇත්තෝ අපේ අප්පුහාමිනං..... ආවෙ හමාර කියන කොට. කමක් නෑ අප්පුහාමි මට උදව් කරන්නෝන" කියලා හාමුදුරුවො සිව්ර ඉනේ ඔතා ගත්තා.

***<u>බේබි අක්කා පස්සට හැරුනා කඩියෙක් කාපුවා වගේ. අනුමාන නෑ, නොන්නො අක්කා බේබි අක්කගේ පස්ස පැත්ත කොනිත්තන්න ඇති.</u>***

අපි කව්රුත් කට ඇර ගෙන බලං හිටියා. හාමුදුරුවංගෙ ඉඟියට අනුව මං බත් බාජනේ අතට ගත්තා. හාමුදුරුවො උපාසක ඇත්තන්ට බත් බෙදුවා. උපාලි හාමුදුරුවෝ පොලොස් පැහි බෙදුවා. සෝබිත හාමුදුරුවො අඹ මාලු බෙදුවා. සුමේද හාමුදුරුවංගෙ අතේ තක්කාලි හොදි බාජනේ.

හාමුදුරුවො කීවා. විතරයි පන්නල හාමිනේ දුවගෙන ගිහිං පොල් සම්බල් බාජනේ අතට ගත්තා. හාමුදුරුවො කියන කොයි වැඩක් උනත් 'නෑ බෑ' නොකිය කරන කෙනෙක් පන්නල හාමිනේ. ගමේ කොයි කව්රුත් ඒක දන්න විත්තිය පන්නල හාමිනෙත් දන්නවා. බේබි අක්කා පස්සට හැරුනා කඩියෙක් කාපුවා වගේ. අනුමාන නෑ, නොන්නො අක්කා බේබි අක්කගේ පස්ස පැත්ත කොනිත්තන්න ඇති.

වෙලාව දොලහට කාලයි දම්බෙදීම ඉවර නෑ.

"හාමුදුරුවනේ, දැන් දොලහට කිට්ටුයි. හාමුදුරුවො වැඩේ අපට බාර දීලා දානෙට වැඩියා නං..." මම ඔර්ලෝසුව දිහෑ බලා ගෙන යි කීවෙ.

"අඃ එහෙමද? කාරි නෑ. මං මේ කරන්නෙ ඉතාම වැදගත් වැඩක්. මං ඊයේ ජනාදිපතිතුමාට 'පැක්ස් පණිවිඩයක් දුන්නා පොසොම් පෝයදාට ලංකාවෙ වෙලාව පැයක් පස්සට දාන්න කියලා" හාමුදුරුවො ඔර්ලෝසුව දිහා බලාගෙන කීවා.

අපි හිටියෙ හිනාව කා ගෙන. මං හොරැහිං අපේ සිරියාවතී උපාසකම්මා දිහෑ බැලුවා. උන්දෑ වමතිං කට වහගෙන හිනාව තද කර ගෙන..

වි.ක.

සන්නස අන්තර් ජාලයෙන් කියවන්න
www.sannasa.net





